ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර යාන්ත්‍රික සහ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර විදුලි තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021

**Open Competitive Examination for Recruitment to Grade III of Railway Technological Management Assistant (Mechanical) and Railway Technological Management Assistant (Electrical) in Management Assistant Technological Service Category Segment - 2-2021**

සංශෝධන 01

ඉහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා පළ කරන ලද 2021.02.05 දිනැති *ගැසට් නිවේදනයේ* 04 හි සඳහන් පහත කොන්දේසිය සංශෝධනය කිරීම.

04. බඳවා ගැනීමේ කොන්දේසි :

2017.06.15 දින වන විට ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා ඇතුලත් කරගෙන ඇති පුහුණුලාභීන් සඳහා පමණක් අදාළ පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ලබා දෙනු ලබන පුහුණු සහතිකය ලබා ඇත්නම් ඉහත අධ්‍යාපන සුදුසුකම් නොසලකා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

යන්න පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අමප/17/2882/709/102-1 හා 2017.12.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා නව වැටුප් ව්‍යුහයක් සකස් කරන තෙක් ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා ඇතුලත් කර ගනු ලබන පුහුණුලාභීන් සඳහා පමණක් අදාළ පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ලබා දෙනු ලබන පුහුණු සහතිකය ලබා ඇත්නම් 2021.02.05 දිනැති *ගැසට් නිවේදනයේ* සඳහන් අධ්‍යාපන සුදුසුකම් නොසලකා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

*ගැසට් නිවේදනයේ* සඳහන් අනිකුත් කරුණු නොවෙනස්ව එලෙසම ක්‍රියාත්මක වේ.

එච්. එම්. නන්දසේන,
අතිරේක සාමාන්‍යාධිකාරී (පරිපාලන),
දුම්රිය සාමාන්‍යාධිකාරී *වෙනුවට.*

2021 පෙබරවාරි මස 09 වැනි දින,